“නුඹලා එය(මුල් සඳ) දුටු විට උපවාසයේ නිරත වන්න. එමෙන්ම නුඹලා එය දුටු විට උපවාසයෙන් මිදෙන්න. නමුත් එය නුඹලා වෙත වැහි වලාවෙන් වැසී ඇත්නම් ඒ සඳහා දින ගණන් බලන්න.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කළ ප්රකාශයකට තමන් සවන් දුන් බව පවසමින් අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “නුඹලා එය(මුල් සඳ) දුටු විට උපවාසයේ නිරත වන්න. එමෙන්ම නුඹලා එය දුටු විට උපවාසයෙන් මිදෙන්න. නමුත් එය නුඹලා වෙත වැහි වලාවෙන් වැසී ඇත්නම් ඒ සඳහා දින ගණන් බලන්න.”
[صحيح] [متفق عليه]

රමළාන් මස ප්රවේශයේ හා එය ඉකුත්ව යෑමේ සළකුණ සම්බන්ධයෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැහැදිලි කරමින් පැවසූහ: ඔබ රමළාන් මාසයේ නව සඳ දුටු විටෙක උපවාසයේ නිරත වන්න. ඔබ අතර හා එය අතර යම් බාධකයක් වී නම් හෝ ඔබට එය මුළා වී ඇත්නම් හෝ ෂඃබාන් මාසය දින තිහක් ලෙස ගණන් බලන්න. ෂව්වාල් මාසයේ නව සද දුටු විට ඔබ උපවාසය අත්හරින්න. ඔබ අතර හා එය අතර යම් බාධකයක් වී නම් හෝ ඔබට එය මුළා වී ඇත්නම් හෝ රමළාන් මාසය දින තිහක් ලෙස ගණන් බලන්න.

https://sunnah.global/hadeeth/si/show/4549